# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2021.07.22

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍ර ලේඛ අංක :- 2020/11 ට පළමු එකතුව**

සියළුම පාලක මණ්ඩල/ විධායක කමිටු සභාපතිවරුන්
සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන් / බැංකු සමිති කළමනාකරුවන්

**<u>සමෘද්ධි බැංකු/ බැංකු සමිති ගොඩනැගිලි ඉදිකිරිම වෙනුවෙන් අරමුදල් සපයා ගැනීමට ණය ලබාගැනීමට අවශ්‍ය උපදෙස්</u>**

01. 2020.09.02 දිනැති සමෘද්ධි ප්‍රජාමුල බැංකු චක්‍රලේඛ අංක 2020/11 මඟින් සමෘද්ධි බැංකු/ බැංකු සමිති ගොඩනැගිලි ඉදිකිරිමට අවශ්‍ය කරන අරමුදල් සඳහා ණය පහසුකම් ලබාගැනීම, ආපසු ගෙවීම සහ ගොඩනැගිල්ල ඉදිකිරිමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා වු ක්‍රියා පිළිවෙත් පිළිබඳ උපදෙස් මුල් චක්‍රලේඛය මඟින් ලබාදෙන ලදී.

02. එම චක්‍රලේඛයේ ඡේද අංක 02 මඟින්, ප්‍රජාමුල බැංකු අංශයෙන් හෝ බැංකු සමිති මඟින් ණය මුදල් ලබාගැනීම සඳහා අවස්ථාව ලබාදී ඇත. එම ආයතන මඟින් ද ණය මුදල් ලබාගැනීමට අමතරව සමෘද්ධි ප්‍රජාමුල බැංකු සහ බැංකු සමිති කළමනාකරණ මණ්ඩල තිරණ අංක 2021/82/11 මඟින්, අරමුදල් ඇති සමෘද්ධි බැංකුව මඟින් ද ණය ලබාගැනීමට අනුමැතිය ලැබී ඇත. එම අනුමැතිය මත මෙම උපදෙස් ලබාදෙන බව සඳහන් කරමි.

03. ලබාගන්නා ණය මුදල් පිළිබඳ විස්තර

I. බැංකු සමිතිය/ බැංකුවකට ලබාගත හැකි උපරිම ණය මුදල - රු. මිලියන 05
II. වාර්ෂික පොලි අනුපාතය - 6.25%
III. ආපසු ගෙවීම් කාලය උපරිම - මාස 60 කි.
IV. මාසිකව ණය වාරික ගෙවීම් සිදු කළ යුතුය.
V. සමෘද්ධි බැංකු ග්‍රාමීය ණය අවශ්‍යතා අරමුදල් ගිණුමහි අරමුදල් භාවිතා කර ණය ලබාදීම.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

04. සමෘද්ධි බැංකු සමිති ගොඩනැගිල්ලක් වෙනුවෙන් ණය ඉල්ලුම් කරන විටක බැංකු සමිතිය විසින්, ප්‍රමාණවත් අරමුදල් තිබෙන බල ප්‍රදේශයේ සමෘද්ධි බැංකු/බැංකු වලින් ණය ලබාගත යුතුය. තවද, සමෘද්ධි බැංකුවක ගොඩනැගිල්ලක් සඳහා ණය ලබාගන්නා විටක, බැංකු සමිතිය විසින් ප්‍රමාණවත් අරමුදල් ඇති සමෘද්ධි බැංකුව/ බැංකු වලින් ණය මුදල ලබාගෙන, අවශ්‍ය කරන සමෘද්ධි බැංකුවට ණය මුදලක් ලෙස ලබාදීම සිදු කළ යුතුය. සෘජුවම බැංකුවකට තවත් බැංකුවකින් ණය මුදල් ලබාගත නොහැක.

05. බැංකු සමිතිය විසින්, ණය අවශ්‍යතාවය පිළිබඳ විධායක කමිටුවට ඉදිරිපත් කර, අනුමැතිය ලබාගෙන ණය ඉල්ලීම අදාල බැංකුවට/ බැංකුවලට ඉදිරිපත් කල යුතුය. එමෙන්ම බැංකුවක් විසින් බැංකු සමිතියකින් ණය මුදලක් ඉල්ලුම් කරන විටක, පාලක මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය.

06. අදාල බැංකුව විසින්, අතිරික්ත අරමුදල් ඇති විටක පාලක මණ්ඩල අනුමැතිය මත ණය අරමුදල් ලබාදිය යුතුය.

07. ණය මුදල ලබාදීමට, මුල් චක්‍රලේඛ හි ඇමුණුම් 02 හි සඳහන් ගිවිසුම සංශෝධන සහිතව සකස් කර බැංකු සමිතිය සහ බැංකුව අතර ගිවිසුම් ගත යුතුය.

08. ණය මුදල නිකුත් කිරීම සහ ණය මුදල භාර ගැනීමට අදාල ගිණුම් සටහන.

**I සමෘද්ධි බැංකුව විසින් ණය මුදල ලබාදීම.**

| | |
|---|---|
| බැංකු/ බැංකු සමිති ගොඩනැගිල්ල ඉදිකිරිමට බැංකු සමිතියට සඳහා ලබාදුන් ණය ගිණුම | - හර (කේත අංකය3192) |
| ජංගම ගිණුම | - බැර |

ණය මුදල මුදාහැරීම සටහන් කිරීමට, මුල් චක්‍රලේඛ හි ඇමුණුම් 05 ආකෘතිය සංශෝධනය කර, ඉන් අනතුරුව නඩත්තු කල යුතුය.

**II බැංකු සමිතිය ණය මුදල භාර ගැනීම**

| | |
|---|---|
| ජංගම ගිණුම | - හර |
| බැංකු/ බැංකු සමිති ගොඩනැගිලි ඉදිකිරිම සඳහා ක්ෂුද්‍ර මුල්‍ය අංශය /සමෘද්ධි බැංකු වලින් ලබාගත් ණය අරමුදල් ගිණුම | - බැර (කේත අංක 9313) |

දැනටමත් බැංකු සමිති පොදු ලෙජරයේ බැංකු ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා ක්ෂුද්‍ර මුල්‍ය අංශයෙන් ලබාගත් අරමුදල් ගිණුම සංශෝධනය කර "බැංකු/ බැංකු සමිති ගොඩනැගිලි ඉදිකිරිම සඳහා ක්ෂුද්‍ර මුල්‍ය අංශයෙන්/ සමෘද්ධි බැංකු වලින් ලබාගත් ණය අරමුදල් ගිණුම" (කේත අංක 9313) නමින් ඉදිරියට පවත්වාගෙන යා යුතුය. එමෙන්ම, මුල් චක්‍රලේඛහි ඇමුණුම් 06 ණය ලෙජරය සංශෝධන කර, ලබාගත් ණය මුදල සටහන් කිරීමට උපයෝගි කරගත යුතුය. එක් එක් ණය මුදල සඳහා වෙන වෙනම ණය ලෙජර් නඩත්තු කල යුතුය.

09. I බැංකු සමිතිය විසින්, සමෘද්ධි බැංකුව වෙත ණය මුදල මුදාහැරීම. මුල් චක්‍රලේඛහි ජේද අංක 7.7 සඳහන් උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. එම ණය සඳහා වාර්ෂික පොලි අනුපාතය 8% වන අතර, මාස 60 න් ණය මුදල ගෙවා අවසන් කල යුතුය.

II ණය මුදල සඳහා චෙක්පත ලද සමෘද්ධි බැංකුව විසින්, චක්‍රලේඛ අංක 2020/11 හි ජේද 7.8 හි උපදෙස් පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

10. සමෘද්ධි බැංකු සමිති ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා බැංකුවකින් ණය මුදලක් ලබාගත් විටක, ගෙවිය යුතු වාර්ෂික පොලි අනුපාතය 6.25% කි.

11. මාසික ණය වාරික සකස් කර ගැනීම, මාසික ණය වාරික ලබාදීම සම්බන්ධ උපදෙස් සඳහා මුල් චක්‍රලේඛ හි සඳහන් පරිදි කටයුතු කරන ලෙස තවදුරටත් දන්වමි.

12. මුල් චක්‍රලේඛ හි "බැංකු ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා බැංකු සමිතියෙන් ලබාගත් අරමුදල් ණය" ගිණුම යන්න සහ කේත අංකය 4058 ලෙසත් සංශෝධනය කර ගන්නා ලෙස දන්වමි.

13. සමෘද්ධි බැංකුවක් තම බැංකු ගොඩනැගිල්ල ඉදිකිරිමට අවශ්‍ය අරමුදල් බැංකුව සතුව තිබුන ද එම අරමුදල් බැංකු සමිතියට ණය මුදලක් ලෙස ලබාදී ණයක් ලෙස බැංකුව වෙත ආපසු ලබාගැනීමට ද අනුමැතිය ලබාදෙමි. එහිදි ද මෙම එකතුවේ උපදෙස් අනුව කටයුතු සිදු කළ යුතුය. මෙවැනි තිරණයක් ගනු ලබන්නේ, බැංකුවේ අරමුදල් සෘජුවම බැංකු ගොඩනැගිල්ලක් වෙනුවෙන් වැය නොකර, පියවරෙන් පියවර බැංකු අරමුදල් බැංකු ගොඩනැගිල්ල වෙනුවෙන් වැය කිරීමට අවස්ථාව සැලසීමයි. අවුරුදු 5 න් අනතුරුව බැංකුවට ස්ථාවර වත්කම හි අයිතිය හිමිවේ.

14. මෙම එකතුවේ සඳහන් නොවන අනිකුත් උපදෙස් සඳහා ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2020/11 තවදුරටත් වලංගු කර ගන්නා ලෙසත් දන්වමි.



ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.